(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **115.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 දෙසැම්බර් 03 බදාදා පූ.භා. 9.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය,** ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත ජයවීර මහතා,** ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අමීර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **ජේ.සී. අලවතුවල මහතා**

ගරු **ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**

ගරු **(වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**

ගරු **එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**

ගරු **ඔෂානි උමංගා මහත්මිය**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**

ගරු **නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**

ගරු **කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **මනෝ ගනේෂන් මහතා**

ගරු **චතුර ගලප්පත්ති මහතා**

ගරු **සමන්මලී ගුණසිංහ මහත්මිය**

ගරු **ඩී. වී. චානක මහතා**

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු චන්දන සූරියආරච්චි මහතා

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදනය කරන ලදී:—

"ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ඉස්මායිල් මුත්තු මුහම්මදු මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය වෙත භාර දී ඇති බවත්, ඒ අනුව දසවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වූ බවත් පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි. එම ලිපිය දැන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය විසින් කියවනු ලැබේ."

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
**PARLIAMENT**

**28.11.2025**

**The Secretary General of Parliament**
**Parliament of Sri Lanka**
**Sri Jayewardenepura Kotte**

Dear Secretary General,

**Resignation from the Position of Member of Parliament**

I hereby tender my resignation as a Member of Parliament of the Democratic Socialist Republic of Sri Lanka, appointed through the National List of the Samagi Jana Balawegaya (SJB), with immediate effect.

I wish to place on record my sincere gratitude to the Hon. Speaker, the Secretary General, the staff of Parliament, and my fellow Members of Parliament for the support extended to me during my tenure.

Kindly take the necessary steps to formalize this resignation lawfully..

Thank you.
Yours faithfully,

**Ismail Mutthu Mohamed,**
**Member of Parliament**

Cc: **Chairman, Elections Commission of Sri Lanka**
**General Secretary, Samagi Jana Balawegaya**
**Secretary General, All Ceylon Makkal Congress**

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXI හා XXXII කොටස්, තෙවැනි කාණ්ඩයේ XXI කොටස සහ නවවැනි කාණ්ඩයේ XVIII හා XIX කොටස් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද යෝජනා කරන ලදී.

(2) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩයේ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ (NIBM) පරිපාලිත සමාගමක් ලෙස පැවති ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය (NSBM) ඇපයෙන් සීමිත සමාගමක් ලෙස පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියේ අවිධිමත්භාවය හා එහි බලපෑම සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද යෝජනා කරන ලදී.

(3) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 71 වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ අරමුදල කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 ඔක්තෝබර් 31 දිනැති අංක 2460/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර, එම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් —

(i) 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2025 නොවැම්බර් 28 දිනැති අංක 2464/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය; සහ

(ii) 2025 අංක 3 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය ප්‍රකාරව 2025.10.01 සිට 2025.10.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ සංවර්ධන කටයුතු වැඩසටහනෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන

ඉදිරිපත් කරන ලදී.

එම ලිපිලේඛන, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2023/2024 වර්ෂය සඳහා සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) පුරවැසි අයවැය - ජාතික අයවැය - 2026;

(ii) අමාත්‍යාංශ අනුව ප්‍රධාන වියදම් සංරචක - අයවැය ඇස්තමේන්තු - 2026;

(iii) අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2026;

(iv) වසර - මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2025;

(v) බදු ආදායම් අහිමිවීම් පිළිබඳ ප්‍රකාශය - 2024/2025;

(vi) මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය 2026-2030 සහ වාර්ෂික ණය ලබා ගැනීමේ සැලැස්ම - 2026;

(vii) ප්‍රධාන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති 2026-2028;

(viii) රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල තොරතුරු - 2025;

(ix) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ නියෝග;

(x) (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වගන්තිය සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් රීති;

(xi) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ රෙගුලාසි (2025 ඔක්තෝබර් 15 දිනැති අංක 2458/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද);

(xii) 2025 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ශීර්ෂය 243 — වැඩසටහන 01, 2025 අංක 4 දරන පරිපූරක ඇස්තමේන්තුව;

(xiii) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත;

(xiv) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ රෙගුලාසි (2025 ඔක්තෝබර් 24 දිනැති අංක 2459/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද);

(xv) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සම්බන්ධයෙන් නියමය;

(xvi) (235 අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් යෝජනා සම්මතය (2025 ඔක්තෝබර් 09 දිනැති අංක 2457/06 දරන අති විශේෂ ගැසට් පත්‍රය);

(xvii) (235 අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වගන්තිය යටතේ, ආනයන තීරු බදු සම්බන්ධයෙන් යෝජනා සම්මතය (2025 නොවැම්බර් 07 දිනැති අංක 2461/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය);

(xviii) 2019 අංක 19 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් සංශෝධනය කරන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 6 වගන්තිය යටතේ ආනයනය කළ භාණ්ඩවල වටිනාකම සම්බන්ධයෙන් නියෝගය; සහ

(xix) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ නියෝගය

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

වැල්ලව, හඳමාගම යන ලිපිනයෙහි පදිංචි විජේසිංහගේ වීරසිංහ මහතාගෙන් ලැබුණු 2025.07.22 දිනැති පෙත්සම ගරු ධර්මප්‍රිය දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. විශ්වවිද්‍යාල (සංශෝධන):** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2026 ජනවාරි 06 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. වරප්‍රසාද (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිනී නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 නොවැම්බර් 18 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. වරප්‍රසාද (අංක 2):** ගරු ගයන්ත කරුණාතිලක මහතා, ගරු කිංස් නෙල්සන් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් 2025 නොවැම්බර් 21 දිනැති ලිපිය මඟින් ගරු කථානායකතුමා වෙත යොමු කරන ලද කරුණු, ගරු කථානායකතුමා විසින් 2025 දෙසැම්බර් 01 වැනි දින පාර්ලිමේන්තුවේ දී ලබාදෙන ලද නියෝගය අනුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. විසර්ජන පනත් කෙටුම්පත— (දහනවවැනි වෙන් කළ දිනය):** කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

ශීර්ෂය 116

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ගරු ගයන්ත කරුණාතිලක මහතා ඉදිරිපත් කළ යෝජනාව,— "වැඩසටහන රුපියල් 10/- කින් අඩු කළ යුතු ය".

(පූ.භා. 10.39 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 12.25 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.40 ට ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 2.42 ට ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 5.56 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 6.23 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"විවාදය දැන් කල් තැබිය යුතු ය"යි ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

එතැන් සිට විවාදය 2025 දෙසැම්බර් 05 සිකුරාදා පවත්වනු ලැබේ.

**9. ස්ථාවර නියෝග 22(4)හි කුමක් සඳහන් වුවද, සභාවේ විශේෂ අවසරය ඇතිව සිදු කරන ලද ඉදිරිපත් කිරීම:** ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 2025 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර, එම පරිපූරක ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. කල් තැබීම:** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

එකල්හි වේලාව අ. භා. 6.30 පසුකර තිබූයෙන්, කථානායකවරයා විසින් අද දින සභා සම්මතිය අනුව අ. භා. 7.08 ට පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, 2025 නොවැම්බර් 13 සභා සම්මතිය අනුව, 2025 දෙසැම්බර් 05 සිකුරාදා පූ. භා. 9.00 වනතෙක් කල් ගියේ ය.